056095
ML/PR
2017/12/05
0039

# රිද්මය, සංවේදිතාව සහ නාට්‍ය කලාව අධ්‍යාපන සංවර්ධනය කෙරෙහි දක්වන උපයෝගීතාව

සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ නර්තන හා නාට්‍ය කලා පීඨයේ පශ්චාද් උපාධි අධ්‍යයන කේන්ද්‍රය මඟින් පවත්වනු ලබන ශාස්ත්‍රපති පර්යේෂණ උපාධිය සඳහා ඉදිරිපත් කරන ස්වාධීන නිබන්ධනයයි.

සම්පූර්ණ නම : චිරංජනී එගොඩගේ
ලියාපදිංචි අංකය : DD/MA/DA/09/037
අධ්‍යයන වර්ෂය : 2008 / 2009

නර්තන හා නාට්‍ය කලා පීඨය
පශ්චාද් උපාධි අධ්‍යයන කේන්ද්‍රය
සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය

UVPA - Lib. Main
056095
056095

# හැඳින්වීම

"රිත්මය සංවේදීතාව හා නාට්‍ය කලාව අධ්‍යාපන සංවර්ධනය කෙරෙහි දක්වන උපයෝගීතාව" නැමති මාගේ ස්වාධීන නිබන්ධ මාතෘකාව තෝරා ගැනීමට හේතු වූයේ නාට්‍යකරණය අධ්‍යාපන කාරකයක් ලෙස පාසල් පන්ති කාමර ක්‍රියාවලියට සම්බන්ධ කර ගැනීමෙන් දරුවන්ගේ අධ්‍යාපන මට්ටම උසස් තලයකට ගෙන යා හැකි බව හැඟී ගිය හෙයිනි. මෙමගින් දරුවා සතුව සහජයෙන් පවත්නා රිත්මය නම් වූ විධිමත් චලනය යම්කිසි අරමුණක් ඔස්සේ වර්ධනය කළ හැකිය. ඒ මඟින් සංවේදීතාව නම් වූ මානව ධර්මතාවය දරුවන්ගේ මනසෙහි වර්ධනය කළ හැකිය. මේ සියලු දේ නාට්‍යකරණය මඟින් සිදු කළ හැකි බව හැඟි ගියෙමි.

පළමු පරිච්ඡේදයේ දී "රිත්මය" යන්න හැඳින්වේ. ලොව පැවැත්ම ඇරඹුනු දා පටන්ම මිනිස් සිතෙහි රිත්මය හා සංවේදීතාවය ජනිත විය. මව්කුස තුළ කලලයක්ව සිටියදී හඳුනා ගන්නා රිත්මය දරුවාගේ වර්ධනයත් සමඟ වර්ධනයට පත්වේ. සෑම දරුවකු සතුවම කිසියම් වූ රිත්මයක් ඇත. තම මවගේ හදවතේ ගැස්ම පළමුව හඳුනා ගන්නා රිත්මයයි. ඒ රිත්මයට සංවේදී වන දරුවා ක්‍රමයෙන් වර්ධනය වනවිට මුළු විශ්වය පුරාම පැතිරී ඇති රිත්මයේ ස්වභාවය ඔහුට අවබෝධ කර ගැනීමට ඉඩ සැලසිය යුතුය. එය කළ හැකි වන්නේ අධ්‍යාපනය මඟිනි. ඒ සඳහා සුදුසු මාධ්‍ය ලෙස නාට්‍යකරණය යොදා ගත හැකි බව මා මෙහිදී සඳහන් කරමි.

දෙවන පරිච්ඡේදයේ දී "සංවේදීතාව" නම් වූ මනාව හැඟීම පිළිබඳව සඳහන් කරමි. මිනිසාට තවත් මිනිසෙකුගේ හැඟීමක් අවබෝධ කර ගැනීමේ හැකියාවක් පවතින බව පැහැදිලිය. අපට තවත් අයෙකුගේ දුකේදී දුක් වීමටත්, සතුටේදී සතුටු වීමටත් හැකියාවක් ඇත්තේ සංවේදීතාව නම් වූ සොඳුරු හැඟීම නිසාය. එහෙත් වර්තමාන සමාජය දෙස බලන විට මේ හැඟීම ගිලිහී ගොස් ඇති බව පැහැදිලි වේ. උගතුන්, බුද්ධිමතුන් මෙන්ම මිනීමරුවන්, අපරාධකරුවන් බිහි වීමටද වගකිව යුත්තේ ඒ රටේ අධ්‍යාපනයයි. රටක සංවර්ධනය මනිනු ලබන්නේ ද ඒ රටේ ආර්ථික තත්ත්වය, දේශපාලන පසුබිම මත පිහිටා නොව රටේ දරුවන් ලබන අධ්‍යාපනය මඟිනි. එසේ නම් අප රටේ වර්තමාන තත්ත්වය දෙස බලන විට සංවේදිතාව නම් මානව ධර්මතාව ගිලිහී ගොස් ඇති බව පැහැදිලිය. ඒ අනුව අධ්‍යාපන ක්‍රියාවලියේ දුර්වලතාවයක් අපට පැහැදිලිවම දක්නට ලැබේ. එබැවින් මා මෙහිදි අවධාරණය කරන්නේ සංවේදීතාව නම් මානව ධර්මතාව වර්ධනය කරවීම සඳහා නාට්‍ය මාධ්‍ය හරහා යම්කිසි උත්සාහයක් ගත හැකි බවයි. එමඟින් මිනිසා සතුව පවතින රිත්මය අවදි කරවා සංවේදීතාව ඇති කළ හැකි බව සඳහන් කරමි.

"නාට්‍යය" යනු කුමක්දැයි හැඳින්වීම තෙවන පරිච්ඡේදයෙන් අපේක්ෂා කෙරේ. ඒ පිළිබඳව හැඳින්වීමට භරතමුනි පඬිවරයා, ඇරිස්ටෝටල් පඬිතුමා ආදි උගතුන්ගේ නිර්වචන යොදා ගතිමි. මෙහිදී අනුකරණය

පිළිබඳව දැඩි අවධානයක් යොමු කරමි. මන්දයත් දරුවන් සතුව නිසඟයෙන්ම අනුකරණාත්මක හැකියාව ඇති බව වැටහී ගිය නිසාවෙනි. දරුවන් තමා අත්විඳින ඕනෑම අත්දැකීමක් අනුකරණය කිරීමට උත්සාහ දරයි. උපතේ පටන්ම අනුකරණය කෙරෙහි විශේෂ ඇල්මක් ඔවුන් සතුවෙයි. එම අනුකරණාත්මක හැකියාව යහපත් අරමුණක් ඔස්සේ වර්ධනය කිරීමට නම් අධ්‍යාපන ක්ෂේත්‍රය කෙරෙහි එම හැකියාව යොදාගත යුතු බව මම වටහා ගතිමි. එම නිසා නාට්‍යකරණය නම් මාධ්‍යය ඔස්සේ අනුකරණය අධ්‍යාපන කාරකයක් සේ යොදා ගත හැකිය. එමඟින් අධ්‍යාපන ක්‍රියාවලිය වඩා සාර්ථක අන්දමින් දරුවාගේ රුචිකත්වය මතම කළ හැකි වේ.

පූර්ව පාසල් වලදී සෑම ක්‍රියාකාරකමක්ව නාට්‍ය මාධ්‍ය භාවිතා කරමින් කරයි. එය සාමූහික ක්‍රියාවකි. නාට්‍ය තුළ සංගීතය, නර්තනය, අභිනය, වචන භාවිතය සියල්ලම ගැබ් වී ඇත. එමඟින් දරුවන්ගේ චින්තන ශක්තිය දියුණු වේ. චිත්තරූප මැවීම, නිර්මාණාත්මක චින්තනය, කුසලතා වර්ධනය සිදුවේ. එබැවින් දරුවාගේ නිර්මාණාත්මක පක්ෂයේ දියුණුවට ලැබෙන්නේ මනා පිටුවහලකි. ඒ සඳහා සාරවත් පරිසරයක් ඇති කළ යුතුය.

නාට්‍යකරණය මඟින් දරුවන්ගේ කණ්ඩායම් හැඟීම, සාමූහිකබව, සහයෝගය වර්ධනය කළ හැකිය. ඉවසීම අන්‍යෝන්‍ය සහයෝගය, විශ්වාසය ගොඩනගා ගැනීමට හැකියාව ලැබේ. එමඟින් ළමුන් තුළ සාරධර්ම ගොඩනැංවිය හැකිය. එකිනෙකා අතර සහයෝගය සහ ඇහුම්කන්දීම මඟින් තව අයෙකුගේ මතයක් ඉවසීමෙන් උනුන් පරයා නැගීමේ තරඟය අවම කරගත හැකිය. අද සමාජයේ බොහෝ ගැටුම්වලට මෙම කරුණු හේතුවේ. යහපත් ආකල්ප වර්ධනය කර ගැනීම මඟින් සාරධර්ම පිරිපුන් සමජයක් ගොඩනගා ගත හැකිය. අධ්‍යාපනයේ අරමුණු හා පරමාර්ථ නාට්‍යකරණය මාධ්‍ය කරගත හොත් ඉටු කර ගැනිම ඉතා පහසුය. ඕනෑම දරුවකු වින්දනීය තත්ත්වයක් ලැබීමට කැමතිය. ස්වභාවධර්මය හා ගැටෙමින් නිදහස් මනසකින් අධ්‍යාපනය ලැබීමට දරුවන්ට හැකිනම් අධ්‍යාපන අරමුණු, පරමාර්ථ සාක්ෂාත් කර ගත හැකිය. එබැවින් නාට්‍යකරණය නම් සෞන්දර්ය මාධ්‍යය පන්තිකාමරය තුළට හඳුන්වාදීම මඟින් අක්‍රීයව සිටින දරුවන් ක්‍රියාශීලි කර අසරණ තත්ත්වයෙන් ගොඩගත හැකි බව පැහැදිලි කිරීම මෙම අධ්‍යයනයේ අරමුණයි.

ලොව ග්‍රහණය කර ගැනීම සඳහා මිනිසා තර්කානුකූල, සහ විද්‍යානුකූල මත යොදා ගනී. එහෙත් ලොව ග්‍රහණය කර ගැනීමට සෞන්දර්යාත්මක චින්තනය ප්‍රමාණවත් යැයි අවසාන වශයෙන් සඳහන් කරමි. ඒ සඳහා කළ යුතු වන්නේ පාසල් අධ්‍යාපනය ක්‍රමවත් පදනමකට ගැනීමය. ඒ සඳහා දරුවන්ගේ රිත්මය හඳුනාගෙන සංවේදීතාව අවදි කරවා ගැනීම හැර අන් මඟක් තිබේ යැයි කිව නොහැකිය. ඒ සඳහා නාට්‍යකරණය යොදා ගත හැකි අතර පාසල් අධ්‍යාපනයේ සාර්ථකත්වය යහපත් සමාජයකට මං පෙත් සාදන බව නියතය.